4 ගෝලීයකරණය, කලාපීකරණය හා ද්විපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් විමසයි.

- ලෝක වෙළෙඳ සංවිධානය :- බහු පාර්ශවීය වෙළෙදාමේ ප්‍රවර්ධනයටත්, වෙළෙදාමේ සුමටව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමටත් වෙළෙදාම හා තීරු බදු පිළිබඳ පොදු සම්මුතිය වඩාත් ශක්තිමත් කරමින් 1995 දී පිහිටුවා ගන් ලැබූ ජාත්‍යන්තර සංවිධානයකි.

මෙහි අරමුණු :-

- ❖ බහු පාර්ශවීය වෙළෙදාම ප්‍රවර්ධනය කිරීම.
- ❖ වෙළෙඳ බාධක අවම කිරීම.
- ❖ වෙළෙඳ නීති සංශෝධනය කරමින් ජාත්‍යන්තර වෙළෙඳ කුමය තුළ ප්‍රතිසංස්කරණ ඇති කිරීම.

- ආර්ථික ගෝලීයකරණය :-ලෝකයේ රටවල් වෙළෙඳ, ප්‍රාග්ධන, මූල්‍ය, තාක්ෂණ, ප්‍රතිපත්ති යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලිය ආර්ථික ගෝලීයකරණය වේ. මේ නිසා ලෝක ඇර්ථිකයේ අන්‍යෝන්‍ය රැදියාව, මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්ධනය, නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය හා ශ්‍රම සංචලනය තීව්‍ර වේ.

ගෝලීයකරණයට පක්ෂව ඇති තර්ක :-

- ❖ ලෝකයේ වෙළෙඳ පරිමාව ඉහළ යෑම.
- ❖ ආර්ථික වෘද්ධි උපාය මාර්ගයක් ලෙස භාවිතා කළ හැකි වීම.
- ❖ විදේශ ආයෝජනය ඉහළ යෑම.
- ❖ විදේශ දේවා නියුක්තිය ඉහළ යෑම.
- ❖ විදේශ මුදල් ප්‍රේෂණ ඇතැම් රටවල ප්‍රධාන විනිමය ප්‍රවාහයක් වීම.
- ❖ අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබාගත හැකි වීම.

අභ්‍යාස

I. ගෝලීය කරගකාරීත්වය තීරණය කරන සාධක පැහැදිලි කරන්න.

II. රටක් ගෝලීයකරණයට නතුවී ඇත්දැයි හඳුනා ගැනීම සඳහා භාවිතා කල හැකි නිර්ණායක මොනවාද ?

III. ගෝලීයකරණ ක්‍රියාවලියේ ශ්‍රී ලංකාව ප්‍රයෝජන ගැනීමට යාමේදී මුහුන දීමට සිදුවන අභියෝග කවරේද ?

IV. ආර්ථික ඒකාබද්ධවීම් යනු කුමක්ද?එහි විවිධ ස්වරූප නම් කරන්න.

V. ගෝලීයකරණයට විපක්ෂව ඇති තර්ක 4ක් ලියන්න.